**ශීර්ෂය 250 - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 250 - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූලි 19 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා වූ මූලික වියදම් ඇස්තමේන්තුව හා සංශෝධිත වියදම් ඇස්තමේන්තුව අතර විචලතාව මූලික වියදම් ඇස්තමේන්තුවට සාපේක්ෂව සියයට 37 ක සිට සියයට 151 ක පරාසයක් තුළ වෙනස් වී තිබුණි. | අපේක්ෂිත ප්‍රමාණයට වඩා විදේශ පුහුණු සහ සම්මන්ත්‍රණ වැඩි වීම, ඡායා පිටපත් යන්ත්‍ර, අළුත්වැඩියා කිරීමේ වියදම් ඉහළ යාම හා New Cigas Server සඳහා හදිසි සේවා ගිවිසුමකට ඇතුලත් වීමට සිදු වීම, මෙහෙයුම් කල්බදු වාරිකය ඉහළ යාම හා වෙළඳපොලේ වාහන අමතර කොටස්වල මිල සීඝ්‍ර ලෙස ඉහළයාම යනාදිය මෙම වෙනස්වීම් සඳහා හේතු වී තිබුණි. | මු.රෙ. 50 විධිවිධාන අනුව වාර්ෂික වියදම් ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිළියෙල කළ යුතු වීම. |
| (ආ) | පුනරාවර්තන වැය විෂයයන් 5 ක් සහ මූලධන වැය විෂයයන් 4 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා ගැනීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට එකතුව රු.40,032,321 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු අතර, එය එක් එක් වැය විෂයයන්ගේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 සිට සියයට 100 දක්වා වූ පරාසයක විය. | 2023.01.27 දිනැති 01/2023 අයවැය චක්‍රලේඛයට අනුව, පුනරාවර්තන ප්‍රතිපාදන සියයට 6 කින් කපා හැරීම යටතේ ප්‍රතිපාදන අවුරා තැබීම, අතිකාල සහ නිවාඩු දින වැටුප් සඳහා නිලධාරීන් සේවයේ යෙදීම සීමා කිරීම, රාජ්‍ය ආයතන අතර රැස්වීම් සහ සාකච්ඡා මාර්ගගත ක්‍රමය යටතේ පැවැත්වීම නිසා ගමන් වියදම් සීමා කිරීම, අත්‍යවශ්‍ය අලුත්වැඩියා පමණක් සිදු කිරීම, මිලදී ගැනීම් සීමා කිරීම, බොහෝ පුහුණු වැඩසටහන් මාර්ගගත ක්‍රමය යටතේ සිදු කිරීම, අන්තර් කාල සීමාව සඳහා රාජ්‍ය ආයතනවලට ගැලපෙන පරිදි වෙනස් කරන ලද ගිණුම්කරණ ප්‍රමිතීන් (Customized Accounting Standards) සඳහා නියමිත අනුමැතිය නොලැබීම හේතුවෙන්, සැලසුම් කළ පරිදි කාර්යය නිම කිරීමට නොහැකි වීම යනාදිය මෙම ප්‍රතිපාදන ඉතිරිවීමට හේතු වී තිබුණි. | - එම - |

### 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාළව 2024 වර්ෂයේ ජනවාරි, පෙබරවාරි හා මාර්තු මාසවල ගෙවා තිබුණු එකතුව රු.65,266 ක් වූ බැරකම් හා බැදීම්, මූල්‍ය ප්‍රකාශනවල බැරකම් හා බැදීම් ප්‍රකාශයේ සටහන් වී නොතිබුණි. | බැරකම් පිළිබඳ ලැයිස්තුව සැකසීමේදී සිදුවූ අතපසු වීමකි. | මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සියලු බැදීම් හා බැරකම් හඳුනාගත හැකි වන පරිදි විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය. |

## 2.3 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

### 2.3.1 විවිධ අත්තිකාරම් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ------------------------- | -------------------------------- | -------------- |
| (අ) 2023 දෙසැම්බර් 31 දිනට විවිධ අත්තිකාරම් ගිණුමේ හිඟ ශේෂය තුල වර්ෂ 05 ට වැඩි රු.124,317,823 ක අත්තිකාරම් ශේෂයක් පැවති අතර එම ශේෂයෙන් සියයට 88 ක් පොළොන්නරුව, අනුරාධපුර සහ අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් අයවිය යුතුව පැවතුණි. එම හිඟ අත්තිකාරම් වටිනාකම් සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල් කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | හිඟ ශේෂ නිරවුල් කර ගැනීම සඳහා ගෙන ඇති පියවර පහත පරිදි වේ.<br>• පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය<br>- ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් අය විය යුතු රු.මිලියන 19 ක මුදල අයකර ගත නොහැකි බැවින් ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් එම මුදල කපා හැරීමටද,<br>- පිරිවැයට වඩා අඩු මිලට සහල් විකිණීම හේතුවෙන් සිදුව ඇති බවට හඳුනාගෙන ඇති රු.මිලියන 2.9 ක අලාභය කපා හැරීම සඳහාද රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.<br>• අනුරාධපුරය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය<br>- වූදිත විසින් හිඟ මුදල් සඳහා දඩුවම් විඳ ඇති බැවින් අනුරාධපුර ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලයේ රු.මිලියන 2 ක මුදල කපා හැරීමට මු.රෙ. 109 ප්‍රකාරව අනුමැතියට යොමු කර ඇත.<br>- නොච්චියාගම විවිධ සේවා සමුපකාර සමිතිය ඈවර කරමින් පවතින අතර ඈවර කටයුතු කඩිනමින් නිම කර අදාළ මුදල් නිරවුල් කරන ලෙස ඈවරකරු වෙත ලිඛිතව දැනුම් දී ඇත.<br>- එප්පාවල විවිධ සේවා සමුපකාර සමිතිය සතු ආයෝජන මුදලක පොලිය මඟින් මාසිකව රු.30,000 බැගින්ද, බීජ ව්‍යාපෘතියේ ලාභයෙන් | පසුවිපරම් කටයුතු විධිමත් කරමින් හිඟ ශේෂ නිරවුල් කිරීම සඳහා ප්‍රමාණවත් ඉදිරි පියවර ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | වාර්ෂිකව රු.500,000 බැගින්ද ගෙවීමට සමිතිය එකඟ වී ඇත.<br>- ගොවිජන සේවා මධ්‍යස්ථාන හා විවිධ සේවා සමුපකාර සමිතියේ රු.මිලියන 18 ක මුදල සම්බන්ධයෙන් නඩු කටයුතු අවසන් වූ පසු ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය.<br><br>• අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය<br>- රු.මිලියන 16.7 ක වටිනාකම සම්බන්ධයෙන් සිදු කරනු ලබන විනය පරීක්ෂණය කඩිනම් කරන ලෙස උපදෙස් ලබා දී ඇත.<br><br>- රු.මිලියන 21.4 සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග අවසන් වූ පසු ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. | |
| (ආ) | අනුරාධපුර ශික්ෂණ රෝහලේ 2019 මාර්තු 02 දින සිදු වූ මුදල් සොරකම හේතුවෙන් සිදුවී ඇති පාඩුව පියවා ගැනීම සඳහා මු.රෙ.106 ප්‍රකාරව නිදහස් කර ඇති රු.6,321,785 ක අත්තිකාරම් මුදල වසර 03 කට වැඩි කාලයක් ගත වුවද, විගණිත දිනය වන විටත් නිරවුල් කරගෙන නොතිබුණි. | අනුරාධපුර පොලිස් ස්ථානය මඟින් සිදු කරනු ලබන විමර්ශන කටයුතු අවසන් වූ පසු නිරවුල් කළයුතු රු.6,321,785 ක මුදල සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. | - එම - |
| (ඇ) | කොළඹ දන්තායතනයේ 2002 දෙසැම්බර් 02 දින සිදුවූ වැටුප් මංකොල්ලයට අදාළව ගොනු කර තිබූ නඩුව 2022 ජූලි 26 දින C 3 අක්ෂරගත කර ඇති බව මාළිගාකන්ද මහේස්ත්‍රාත් අධිකරණය සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත දැනුම් ද ඇති අතර, සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් මෙම මුදල කපා හැරීම සඳහා 2022 සැප්තැම්බර් 23 දින පොදු 285 අයදුම්පත් ඉදිරිපත් කර ඇතත්, මෙම මුදල් කපා හැරීමට හෝ වෙනත් ක්‍රියාමාර්ගයකට එළඹීම සඳහා විගණිත දිනය වන විටත් කටයුතු කර නොතිබුණි. | අදාළ අලාභය කපා හැරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත අයදුම්පත් ඉදිරිපත් කර ඇති අතර අදාල කපා හැරීම සම්බන්ධයෙන් සලකා බැලීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් සවිස්තරාත්මක තොරතුරු වාර්තාවක් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් වෙතින් ඉල්ලුම් කර ඇත. | - එම - |

## 2.4 මූල්‍ය නොවන වත්කම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයන් යටතේ මූලධන වියදම් ලෙස රු.1,718,656 ක වටිනාකමක් දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂය සඳහා එම වටිනාකම රු.88,125 ක් වීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.1,630,531 කින් වැඩියෙන් දක්වා තිබුණි. මෙම වැඩියෙන් දක්වා තිබීම තුළ මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීමේ වියදම් හා හැකියා වර්ධන වියදම් ඇතුළත් වී තිබුණු බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | මූල්‍ය ප්‍රකාශනයන්හි ඒසීඒ - සී ආකෘති පත්‍රයෙහි (මුදල් ප්‍රවාහ ප්‍රකාශය) වාර්ෂික අයවැය ඇස්තමේන්තුවල ඇතුළත් වියදම් වර්ගීකරණයන්ට අනුරූපව ප්‍රාග්ධන වියදම් වර්ගීකරණය කර ඇති බැවින්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයද එපරිදි සකස් කර ඇත. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය සැකසීමේදී ගිණුම්කරණ මූලධර්මයන්ට අදාළව මුදල් ප්‍රවාහයන් වර්ගීකරණය කර ගතයුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) භාණ්ඩාගාර මෙහෙයුම් කටයුතු ස්වයංක්‍රීය කිරීම සඳහා ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතියක් (ITMIS) හඳුන්වා දීම 2010 වර්ෂයේදී ආරම්භ කර තිබුණු අතර, ඒ වෙනුවෙන් සමස්ත ආයෝජනයේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 7,920 කට සමාන ඇ.ඩො. මිලියන 60 ක් වී තිබුණි. 2023 දෙසැම්බර් 31 දින වන විට ආසන්න වශයෙන් වසර 13 ක කාලයක් ගත වී තිබූ අතර, විගණනයට ලද තොරතුරු මත රු.මිලියන 5,647 ක වියදමක් දරා තිබුණද, මෙම පද්ධතිය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ලද මූලික | ITMIS හඳුන්වාදීම 2010 වර්ෂයේ සිට මූල්‍ය කළමනාකරණ කාර්යක්ෂමතා ව්‍යාපෘතිය (FMEP) මගින් සිදුකර ඇත. එම පද්ධතියේ ප්‍රධාන ක්‍රියාකාරී ක්ෂේත්‍ර ව්‍යාප්තිය සඳහා 2019 වසරේ ජූලි මස අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ඒ වනවිටත් පද්ධතියේ අයවැය සැලසුම් කිරීම සහ අයවැය විසර්ජනයට අදාළ ක්‍රියාකාරීත්වයන් ව්‍යාප්තිය FMEP ව්‍යාපෘතිය මගින් සම්පූර්ණ කොට තිබිණ. 2019 වසරේ පාස්කු බෝම්බ ප්‍රහාරයට පසුව ඇතිවූ තත්වයන්, 2020 සහ 2021 වසරවල COVID වසංගතය පැතිරයාම හේතුවෙන් වූ ඇඳිරි නීති පැනවීම් සහ රට වසා දැමීමේ තත්වයන් සහ 2022 වසරේ ඇතිවූ දේශපාලන සහ ආර්ථික අර්බුදය හේතුවෙන් ITMIS පද්ධතියේ ව්‍යාප්ත | දැනටමත් පසුගාමී වී ඇති බැවින්,පද්ධතිය කඩිනමින් සම්පූර්ණ වශයෙන් සංවර්ධනය කර, ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| ප්‍රධාන ක්‍රියාකාරකම් ක්ෂේත්‍ර 13 සම්පූර්ණ වශයෙන් සංවර්ධනය කර ක්‍රියාත්මක කරන තත්ත්වයකට පත් වී නොතිබුණි. කෙසේ වුවද විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2023 දෙසැම්බර් 31 දින වන විට ITMIS පද්ධතිය සම්බන්ධයෙන් එළඹී ගිවිසුම් අනුව 2023 දෙසැම්බර් 31 දිනට රු.43,887,382ක් හා ඇ.ඩො. 989,103 ක මුදලක්ද සේවා සපයන ආයතන වෙත තවදුරටත් ගෙවිය යුතුව පැවතුණු බව නිරීක්ෂණය විය. | කටයුතු නිසි පරිදි සිදු කරගෙන යාමට බාධා පැමිණවීය. 2023 වසරේ මුල් භාගයේදීද අමාත්‍යාංශ මගින් සිදුකල ව්‍යාපෘති ඇගයීම් කටයුතු හේතුවෙන් පද්ධතියේ ව්‍යාප්තිය සිදුකල හැකි නොවීය. ඒ අනුව වසර 4ක පමණ කාලයක් ITMIS පද්ධතියේ ව්‍යාප්තිය නිසි පරිදි සිදුකිරීමට නොහැකි විය. | |
| (ආ) ITMIS පද්ධතිය ආරම්භයේ සිට ඒ තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතව පැවතුන, වැටුප් කළමනාකරණ ක්‍රියාකාරකම් ක්ෂේත්‍රය ස්ථාපනය කර ක්‍රියාත්මක කිරීමකින් තොරව 2016 වර්ෂයේදී e-Payroll නැමති වෙනත් වැටුප් කළමනාකරණ පද්ධතියක් මුදල් අමාත්‍යාංශයට පමණක් හඳුන්වා දී තිබූ අතර, ඒ වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දින වන විට රු.5,704,871 ක වියදමක් ද දරා තිබුණි. | 2016 වසර වනවිට මුළු රාජ්‍ය අංශය සඳහාම වැටුප් කළමනාකරණ ක්‍රියාකාරකම් පද්ධතියක අවශ්‍යතාව මුදල් අමාත්‍යාංශය මගින් හඳුනාගෙන තිබිණි. ඉහත ITMIS පද්ධතිය තුලින් මුදල් අමාත්‍යාංශය සඳහා පමණක් හඳුන්වා දීමට තිබූ වැටුප් කළමනාකරණ ක්‍රියාවලිය සීමා සහිත වූ අතර එය මුළු රාජ්‍ය අංශය සඳහාම යොදා ගැනීමට යෝග්‍ය නොවීය. තවද එවැනි වපසරියක එම ක්‍රියාවලිය ITMIS පද්ධතිය තුලින් ව්‍යාප්ත කිරීම ආර්ථිකමය අතින්ද අවාසිදායකය. එබැවින් 2016 වසරේ අප්‍රේල් මස පැවති අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති රැස්වීමේදී මුළු රාජ්‍ය අංශය සඳහාම වැටුප් කළමනාකරණය වෙනුවෙන් වෙනත් මෘදුකාංගයක් ලබාගැනීමට ගත් තීරණය අනුව e-payroll වැටුප් කළමනාකරණ පද්ධතිය මේ වනවිට ක්‍රියාත්මක කරගෙන යනු ලබයි. | ආර්ථිකභාවය සහ කාර්යක්ෂමතාවය පිළිබඳ විශේෂ අවධානය යොමු කර මුළු රාජ්‍ය අංශය සඳහා වැටුප් කළමණාකරන පද්ධතියක් ක්‍රියාත්මක කිරීම කඩිනම් කර ගත යුතුය. |
| (ඇ) 2023 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, මධ්‍යම රජයේ, රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් (8493) ශේෂය රු.මිලියන 30,720 ක් වුවද, විගණනය වෙත ඉදිරිපත් කරන ලද කාල විශ්ලේෂණය අනුව එම ශේෂය රු. මිලියන 30,516 ක් විය. ඒ අනුව රු. මිලියන 204 ක වෙනසක් නිරීක්ෂණය විය. | සියළුම ආයතන වල වාර්ෂික කාල විශ්ලේෂණ වාර්තා අප විසින් පරීක්ෂා කර, නිරන්තරයෙන් පසු විපරම් කර අදාල ආයතන සම්බන්ධීකරණය කරමින් එම ශේෂයන් නිවැරදිව පවත්වාගෙන යාමට කටයුතු කරන මෙන් දැනුවත් කරනු ලබයි. අක්‍රීය ශේෂයන් සම්බන්ධව දෙපාර්තමේන්තුව සතුව පවතින පැරණි තොරතුරු විශ්ලේෂණය කර අක්‍රීයව පැවතීමට හේතු නිවැරදිව හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී. | ශේෂයන් නිරවුල් කිරීම සඳහා කඩිනමින් පියවර ගෙන පවත්නා පද්ධතිය වැඩි දියුණු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ඇ) 2023 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් (8493) කාල විශ්ලේෂණය අනුව, පළාත් සභාවල ආයතන වලට මාරු වී ගිය නිලධාරීන්, සංස්ථා, මණ්ඩල සහ පළාත් සභා සඳහා ස්ථිර වශයෙන් මුදා හැර ඇති නිලධාරීන්, මිය ගිය නිලධාරීන්, විශ්‍රාම ගිය නිලධාරීන්, වැඩ තහනම් කරන ලද නිලධාරීන්, සේවය හැර ගිය/ අවසන් කළ නිලධාරීන්, ද්විතීය පදනම මත සේවයේ යොදවා ඇති, විදේශගත /දේශීය නිවාඩු සහ වෙනත් යන වර්ග යටතේ වන නිලධාරීන්ගෙන් අයවිය යුතු වසර 5 ත් 10 ත් අතර ශේෂය රු.112,939,218 ක් වූ අතර, වසර 10 කට වැඩි එසේ අයවිය යුතු ශේෂය රු.277,066,082 ක් වී තිබුණි. | මෙම ණය ශේෂයන්, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා පවතින චක්‍රලේඛ විධි විධාන අනුගමනය කර නිරවුල් කර ගැනීම ඒ ඒ ආයතන වල ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්ගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීමකි. කාර්තුමය වශයෙන් එම ආයතන වල ප්‍රගතිය ගෙන්වා ගනිමින් ණය ශේෂයන් අයවීම් ප්‍රගතිය පරීක්ෂා කරමින්, අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබා දෙමින් නිරන්තරයෙන් පසු විපරම් කරනු ලබයි. | - එම - |

## 4. මානව සම්පත් කළමනාකරණය

### 4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය සහ තත්‍ය කාර්ය මණ්ඩලය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ පැවති පුරප්පාඩු 44 ක් අතරින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 12 ක් ද, තෘතිය මට්ටමේ පුරප්පාඩු 02 ක් ද, ද්විතියික මට්ටමේ තනතුරු 27 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 03 ක් පුරප්පාඩුව පැවතුණි. අදාළ තනතුරු පිරවීමට හෝ කාර්යමණ්ඩල විශ්ලේෂණයක් සිදු කර අනවශ්‍ය තනතුරු යටපත් කිරීමට හෝ සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | එම පුරප්පාඩු අතරින් මේ වන විට ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩුව ඇති තනතුරු සඳහා නිලධාරීන් අනුයුක්ත කිරීම සිදු කරන ලෙස මුදල් අමාත්‍යාංශ ලේකම් මඟින් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් දැනුවත් කර ඇති අතර මෙතෙක් ඒ සඳහා නිලධාරීන් ලැබී නොමැත. | පුරප්පාඩු පිරවීමට හෝ කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |